# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
# පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු නාමය - සහකාර නීති නිලධාරි**
**සේවා ගණය - කණිෂ්ඨ කළමනාකාර - (JM 1-1)**
**පුරප්පාඩු ගණන - 01**

**01.1. සුදුසුකම්**

**01.1.1. බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වීම.

සහ

නීතිඥවරයෙකු හා නොතාරිස්වරයෙකු ලෙස වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

**01.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**01.2. වයස**

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**01.3. වැටුප් කේත අංකය** - JM 1-1

**01.4. මාසික වැටුප් පරිමාණය** - 2025.01.01 දින සිට

JM 1-1-2025 ක.සේ.ව. 01/2025 රු.(72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

<u>**මෙම තනතුර සඳහා පොදු කරුණු :**</u>

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් සම්පූර්ණ කළ යුතුය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.nddcb.gov.lk වෙත පිවිස, "**වෘත්තීන්**" (https://www.nddcb.gov.lk/sinhala/careers.php) හි දක්වා ඇති උපදෙස් පරිදි අයදුම්පත සම්පූර්ණ කර **Submit Application** කිරීමෙන් අනතුරුව එහි පිටපත බාගත කර, එම දෑඩ පිටපතට මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත අමුණා ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කර යුතුය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය**

බඳවාගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වාභාවය**

ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**අයදුම්පත් ගාස්තුව**

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ ආයතනික ශාඛාව (Corporate Branch) අංක 00001643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

බාගත කරන ලද අයදුම්පත (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2025.11.21** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ බාගත (Downloaded Application) අයදුම්පත හැර යොමුකරන ලද වෙනත් අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.**

**සභාපති**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**383, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

ප්‍රකාශිත දිනය : 2025.10.31